ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා ධාරිතා පුහුණු වැඩසටහනක්

ශ්‍රී ලංකා රජයේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් 20 දනෙක්‌ගෙන් සමන්විත දූත පිරිසක් 2026 ඔක්තෝබර් 05-16 දක්වා ඉන්දියාවේ නව දිල්ලි නුවර අධ්‍යාපන සැලසුම් සහ පරිපාලන ආයතනයේ (NIEPA) පැවති විශේෂ පුහුණු සහ ධාරිතා සංවර්ධන වැඩසටහනකට සහභාගී වූහ.

2. මමෙ වැඩසටහනට අධ්‍යාපන ප්‍රතිපත්ති සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම; නායකත්වය සහ ආයතනික කළමනාකරණය; පාසල් අධීක්ෂණය සහ ගුණාත්මකභාවය සහතික කිරීම; පාලනය සහ වගවීම; ඩිජිටල් සාක්ෂරතාවය සහ තාක්ෂණයෙන් සවිබල ගැන්වූ ඉගනේීම; දත්ත පදනම් කරගත් තීරණ ගැනීම; උපායමාර්ගික සැලසුම්කරණය සහ සම්පත් කළමනාකරණය; පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය සහ අධ්‍යාපන පරිපාලනය තුළ ජාත්‍යන්තර හොඳම භාවිතයන් යනාදිය ආවරණය කරමින් තාක්ෂණික සැසි සහ දැනුම බදෝ හදා ගැනීමේ සැසි රැසක් ඇතුළත් විය.

3. මමෙ වැඩසටහන තුළින් විශේෂයෙන්ම ශ්‍රී ලංකා සන්දර්භය තුළ නව්‍ය කළමනාකරණ ප්‍රවේශ, ඵලදායී නිරීක්ෂණ සහ ඇගයීම් යාන්ත්‍රණ සහ සාර්ථක අධ්‍යාපනික භාවිතයන් ප්‍රයෝගිකව භාවිතා කිරීම සම්බන්ධයෙන් ද අවධානය යොමු කරන ලදී.

4. ශ්‍රී ලාංකීය වෘත්තිකයන් සඳහා වාර්ෂිකව විශේෂයෙන් සකසන ලද පුහුණු අවස්ථා 700ක් පිරිනමන බවට අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා සිය 2025 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුර නිවේදනය කළ අතර ඒ අනුව මමෙ වැඩසටහන සංවිධානය කර තිබිණ. ඉන්දියාවේ යහපාලනය සඳහා ජාතික මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් යටතේ ශ්‍රී ලංකා රජයේ සේවකයන් 300 දනෙක්‌ට වාර්ෂිකව පුහුණු අවස්ථා හිමි වන අතර ඒ අනුව දැන් ඉන්දියාවේ ධාරිතා සංවර්ධන ප්‍රයත්නයන් තුළින් වාර්ෂිකව ශ්‍රී ලාංකිකයන් 1000කට ප්‍රතිලාභ සැලසේ.

****

කොළඹ
2026 ඔක්තෝබර් 16